// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ
අංක 2108/40 - 2019 ජනවාරි මස 30 වැනි බදාදා - 2019.01.30
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී. බී 9/73 (XI)

**(469 වන අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 30 වන වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 71 වන වගන්තිය යටතේ සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ජෝන් අමරතුංග,
සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය.

2019 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2012 සැප්තැම්බර් මස 06 වන දින අංක 1774/27 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ 2012 අංක 1 දරන මුහුදු ක්ෂීරපායී සතුන් (නිරීක්ෂණ, නියාමන සහ පාලන) නියෝග පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) 13 වන නියෝගය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

''13 (1) මුහුදු ක්ෂීරපායී සතුන් නිරීක්ෂණය කිරීමට අදහස් කරන සෑම තැනැත්තකු ම හෝ පුද්ගල කණ්ඩායමක් ම ඒ සඳහා අවසර පත්‍රයක් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා බලය ලබා දෙනු ලබන සහ පිටත්වීමේ ස්ථානයේ සිටින නිලධරයකුගෙන් ලබා ගත යුතු ය.

(2) එවැනි අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තා IV වන උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයේ නියම කරනු ලබන තොරතුරු ඉදිරිපත් කළ යුතු ය.

(3) එසේ නිකුත් කරනු ලබන අවසර පත්‍රය V වන උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයෙන් විය යුතු ය. VI වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ගෙවීමෙන් පසුව එම අවසර පත්‍රය නිකුත් කරනු ලැබිය යුතු ය.'' ;

(2) V වන උපලේඛනය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

### "V වන උපලේඛනය

*වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත*

*මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීමේ කාර්ය සඳහා නිකුත් කරනු ලබන අවසර පත්‍රය*

......................................... දින පෙ.ව. 5.30 සිට ප.ව. 7.00 දක්වා කාලය තුළ ......................................... කලාපයේ අංක .................. දරන යාත්‍රාව භාවිත කරමින් මුහුදු ක්ෂීරපායී සතුන් නිරීක්ෂණය කිරීම සඳහා ............................................ පදිංචි ................................................ මහතා/මහත්මියට හා/හෝ පුද්ගලයන් .............................................. සමන්විත ඔබේ කණ්ඩායමට මෙයින් බලය පවරනු ලැබේ.

**කොන්දේසි**

(i) මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීමේ කාර්ය සඳහා, අවසරපත්‍ර දරන්නා/දරන්නන් විසින්, අවසර ලබා දී ඇති සමුද්‍රීය කලාපය පමණක් භාවිත කළ යුතු ය.

(ii) අවසර ලබා දී ඇති යාත්‍රාව තුළ අවසර ලබා නොමැති තැනැත්තන් රැගෙන නොයා යුතු ය.

(iii) ක්ෂීරපායි සතුන් නැරඹීම දිනයේ නියමිත වේලාවන් තුළ පමණක් සිදු කළ යුතු ය.

(iv) ක්ෂීරපායි සතුන් නරඹන අතරතුර එම සතුන්ගේ ස්වභාවික පැවැත්මට අහිතකර කිසිදු දෙයක් නොකළ යුතු ය.

(v) ක්ෂීරපායි සතුන් නරඹන අතරතුර මුහුදට ආහාර ද්‍රව්‍ය විසි කිරීම නොකළ යුතු ය.

(vi) මෙම අවසර පත්‍රය අන්සතු කළ නොහැක.

(vii) අවසර පත්‍ර දරන්නා/දරන්නන් (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ පනවන ලද රීති, නියෝග සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

### VI වන උපලේඛනය

*I වන කාණ්ඩය*

*කල්පිටිය සහ ත්‍රිකුණාමලය යන සමුද්‍රීය කලාප තුළට ප්‍රවේශවීමේ ගාස්තු*

| *අංකය* | *I වන තීරය*<br>*පුද්ගලයන් පිළිබඳ විස්තර* | *II වන තීරය*<br>*ගාස්තු* |
|---|---|---|
| 1. | වැඩිහිටි (දේශීය) | රු.20.00 |
| 2. | ළමුන් (දේශීය) (වයස අවුරුදු 6 - 12 අතර) | රු.10.00 |
| 3. | වැඩිහිටි (විදේශීය) | ඇ.ඩො. 8 ක් හෝ ඊට සමාන මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් |
| 4. | ළමුන් විදේශීය (වයස අවුරුදු 6-12 අතර) | ඇ.ඩො. 4ක් හෝ ඊට සමාන මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් |
| 5. | පාසැල් ළමුන් (එක් අයෙකු සඳහා) | රු.5.00 |

*II වන කාණ්ඩය*

*මිරිස්ස සමුද්‍රීය කලාපයට ප්‍රවේශවීමේ ගාස්තු*

| *අංකය* | *I වන තීරය*<br>*පුද්ගලයන් පිළිබඳ විස්තර* | *II වන තීරය*<br>*ගාස්තු* |
|---|---|---|
| 1. | වැඩිහිටි (දේශීය) | රු.150.00 |
| 2. | ළමුන් (දේශීය) (වයස අවුරුදු 6 - 12 අතර) | රු.75.00 |
| 3. | වැඩිහිටි (විදේශීය) | ඇ.ඩො. 15 ක් හෝ ඊට සමාන මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් |
| 4. | ළමුන් විදේශීය (වයස අවුරුදු 6-12 අතර) | ඇ.ඩො. 7.50 ක් හෝ ඊට සමාන මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් |
| 5. | පාසැල් ළමුන් (එක් අයෙකු සඳහා) | රු.5.00 |
| 6. | සේවා ගාස්තු (දේශීය එක් අයකු සඳහා) | රු.50.00 |
| 7. | සේවා ගාස්තු (විදේශීය එක් අයකු සඳහා) | ඇ.ඩො. 1 ක් හෝ ඊට සමාන මුදල ශ්‍රී ලංකා රුපියල්වලින් |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.